ඉන්දියානු රජයේ විදේශ කටයුතු අමාත්‍යාංශය

මාධ්‍ය නිවේදනය

## ඉන්දීය විදේශ ලේකම්තුමාගේ ශ්‍රී ලංකා සංචාරය

ඉන්දීය විදේශ ලේකම් ශ්‍රී වික්‍රම් මිස්රි මැතිතුමා 2026 අගෝස්තු 05 වන දින ශ්‍රී ලංකා නිල සංචාරයක නිරත විය. මෙය විදේශ ලේකම්තුමා වශයෙන් එතුමා සිදු කළ පළමු ස්වාධීන සංචාරය විය. එතුමා මින් පෙර, එනම් 2025 අප්‍රේල් මස ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ සංචාරයේ සහ 2026 අප්‍රේල් මස උප ජනාධිපති ශ්‍රී සී. පී. රාධාක්‍රිෂ්ණන් මැතිතුමාගේ සංචාරයේ දූත මණ්ඩල සාමාජිකයකු ලෙස ශ්‍රී ලංකාවට පැමිණ ඇත.

2. මෙම සංචාරය අතරතුර විදේශ ලේකම්තුමා ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු අනුර කුමාර දිසානායක මැතිතුමා, ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ආචාර්ය අතිගරු හරිනි අමරසූරිය මැතිනිය සහ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය අතිගරු විජිත හේරත් මැතිතුමා හමු විය. එසේම, එතුමා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම් අරුණි රණරාජා මහත්මිය සමඟ ද සාකච්ඡා පැවැත්වීය. විදේශ ලේකම්තුමා විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ද හමු වූ අතර ශ්‍රී ලංකා දෙමළ සහ ඉන්දීය සම්භවයක් සහිත දෙමළ ප්‍රජාවේ නායකයන් ද වෙන වෙනම හමු විය.

3. මෙම හමුවලදී, විදේශ ලේකම්තුමා ඉන්දියාවේ අසල්වැසියා ප්‍රථමයෙන් යන ප්‍රතිපත්තිය සහ මහාසාගර් (MAHASAGAR) යන දැක්ම යටතේ ශ්‍රී ලංකාව උදෙසා ඉන්දියාවේ අචල කැපවීම අවධාරණය කළේය. දෙපාර්ශ්වය විසින් ද්විපාර්ශ්වික කරුණු සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක සහයෝගීතාවය සහ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් පුළුල් සමාලෝචනයක් ද සිදු කරන ලදී.

4. දිට්වා සුළි කුණාටුවෙන් අනතුරුව ප්‍රකාශයට පත් කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 450ක ප්‍රතිසංස්කරණ පැකේජය යටතේ පවතින ව්‍යාපෘතීන් ඇතුළු විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී ලබා ඇති ප්‍රගතිය සතුටුදායි මට්ටමක පවතින බව ඔවුහු ප්‍රකාශ කළහ. විශේෂයෙන්ම, මෙහිදී ඔවුහු දුම්රිය ක්ෂේත්‍රයේ ව්‍යාපෘතීන් සඳහා වන ඇමරිකානු ඩොලර් මිලියන 250ක ඉන්දියානු රුපියල්වලින් නාමනය කරන ලද සහනදායි ණය පහසුකම් දෙක සහ පශු සම්පත් සහ වෙනත් ප්‍රමුඛ අවශ්‍යතාවයන් සඳහා

වන ඇමරිකානු ඩොලර් මිලියන 100ක ඉන්දියානු රුපියල්වලින් නාමනය කරන ලද සහනදායී ණය පහසුකම් සම්බන්ධ ගිවිසුම්වල කටයුතු අවසන් කිරීම සම්බන්ධයනේ සතුට පළ කළහ. ඉන්දියාවේ එක්සිම් බැංකුව (EXIM Bank of India) සහ ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍යාංශය අතර අත්සන් තබන ලද ගිවිසුම් ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර ලේකම්තුමා සහ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස්තුමා විසින් ශ්‍රී ලංකා ජනාධිපතිතුමා ඉදිරියේදී හුවමාරු කර ගන්නා ලදී. දිට්වා ප්‍රතිසංස්කරණ පැකේජය යටතේ හානි වූ නිවාස නැවත ඉදි කිරීම සහ ස්ථාවර පාලම් ඉදිකිරීම නුදුරේදීම ඇරඹෙනු ඇති බව දපොර්ශ්වය විසින් සඳහන් කරන ලදී. මයෙ එම පැකේජය යටතේ පිරිනැමනෙ ඇමරිකානු ඩොලර් මිලියන 100ක ප්‍රදානය යටතේ ආවරණය කෙරේ. වනෙත් ස්ථානයකට රැගනෙ යනු ලබන දනෙියාය රෝහල සඳහා වෛද්‍ය උපකරණ සැපයීම සම්බන්ධයනේ ද ප්‍රගතියක් ළඟා කර ගනෙ ඇති අතර මේ සඳහා වන අවබෝධතා ගිවිසුම 2026 ජූලි 13 වන දින අත්සන් තබන ලදී. එසේම, ශ්‍රී ලංකාවට වෛද්‍ය කුට් සැපයීම සහ දිවයින පුරා අධ්‍යාපන ආයතනවලට උපකරණ සැපයීම සම්බන්ධයනේ ද ප්‍රගතියක් අත්කර ගනෙ ඇත. ශ්‍රී ලංකාව පුරා ආපදා අනතුරු ඇඟවීම් පද්ධතියක් හැකි ඉක්මනින් ක්‍රියාත්මක කිරීම සඳහා ද දපොර්ශවය විසින් කටයුතු කරමින් සිටියි. ඇමරිකානු ඩොලර් මිලියන 5ක ප්‍රදානයක් යටතේ උතුරු දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු අවසන් කර දුම්රිය සේවා නැවත ආරම්භ කර තිබීම සම්බන්ධයනේ ද ඔවුහු සතුට පළ කළහ.

5. විදුලිබල ජාල අන්තර් සම්බන්ධතා ව්‍යාපෘතිය, සාම්පූර් සූර්ය විදුලිබල ව්‍යාපෘතිය සහ ත්‍රිකුණාමලය බලශක්ති කේන්ද්‍රස්ථානයක් ලසෙ සංවර්ධනය කිරීම ඇතුළු බලශක්ති ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම සම්බන්ධයනේ ද දපොර්ශ්වය විසින් සාකච්ඡා කරන ලදී. ශ්‍රී ලංකා අනන්‍ය ඩිජිටල් හැඳුනුම්පත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ටනේඩර් ක්‍රියාවලිය හැකි ඉක්මනින් අවසන් කිරීම සඳහා කටයුතු කිරීමට ද ඔවුහු එකඟ වූහ. ඇමරිකානු ඩොලර් මිලියන 61.5ක ප්‍රදානයක් යටතේ කන්කසන්තුරය වරාය ප්‍රතිසංස්කරණය සහ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුමක් අවසන් කිරීම සඳහා සාකච්ඡා හැකි ඉක්මනින් ආරම්භ කිරීමට ද ඔවුහු උපදසෙ දුන්හ. ඉන්දීය අග්‍රාමාත්‍යතුමාගේ 2025 අප්‍රේල් ශ්‍රී ලංකා සංචාරය අතරතුර සිදු කළ නිවේදනය සිහිපත් කරමින් දපොර්ශ්වය 1990 සුව සැරිය ගිලන්රථ සේවය පුළුල් කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුම කඩිනමින් අවසන් කළ යුතු බවට ද එකඟ වූහ. පසුගිය වසරේ අග්‍රාමාත්‍යතුමාගේ සංචාරය අතරතුර නිවේදනය කළ ධාරිතා සංවර්ධන වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වමේින් පවතින බව ද පළමු වසරේදී විවිධ ක්ෂේත්‍රවල ශ්‍රී ලාංකික වෘත්තිකයන් 1,000ක් පමණ ආවරණය කර ඇති බව ද ඔවුහු සඳහන් කළහ.

6. වතුකර ප්‍රජාව සඳහා ක්‍රියාත්මක ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ සිව් වන අදියර යටතේ ලබා ඇති ප්‍රගතිය සිහිපත් කරමින් විදේශ ලේකම්තුමා 2017 වසරේදී ඉන්දිය අග්‍රාමාත්‍යතුමාගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර නිවේදනය කරන ලද ඉන්දිය සම්භවයක් සහිත දමෙළ ප්‍රජාව සඳහා වන නිවාස 10,000ක ව්‍යාපෘතියේ සියලු නිවාස ඉදි කිරීම ඇතුළු ඉන්දිය සම්භවයක් සහිත දමෙළ ප්‍රජාව සඳහා වන විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම වේගවත් කරන ලෙස ශ්‍රී ලංකා පාර්ශ්වයෙන් ඉල්ලා සිටියේය.

7. ආර්ථික කරුණු සම්බන්ධයෙන් අපගේ හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් ද සාකච්ඡා කරන ලදි. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින නිදහස් වෙළෙඳ ගිවිසුම යාවත්කාලීන කිරීම සඳහා මෙම වසරේ ජූනි මාසයේදී පැවති මූලික සාකච්ඡා සහ එම සාකච්ඡා ඉදිරියට ගෙන යාමට ගත් තීරණය සම්බන්ධයෙන් දෙපාර්ශ්වය විසින් සතුට පළ කරන ලදි. ඉන්දියා-ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ ගිවිසුම සම්බන්ධ සාකච්ඡා සාර්ථකව අවසන් වීම සම්බන්ධයෙන් ද ඔවුහු සතුට පළ කළහ. දෙපාර්ශ්වය විසින් අවශ්‍ය අභ්‍යන්තර ක්‍රියාවලීන් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එම ගිවිසුම නුදුරේදී අත්සන් කිරීමට අපේක්ෂිතය.

8. සංචාරය අතරතුර, විදේශ ලේකම්තුමා ධීවරයන්ට සම්බන්ධ ගැටලු පිළිබඳව ද සාකච්ඡා කළ අතර ශ්‍රී ලංකාවේ රඳවා ගෙන සිටින ධීවරයන් සහ බෝට්ටු කඩිනමින් නිදහස් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සහයෝගය ඉල්ලා සිටියේය. පවතින විවිධ ගැටලුවලට විසඳුමක් සොයා ගැනීම සඳහා ද්විපාර්ශ්වික යාන්ත්‍රණයන් අඛණ්ඩව ක්‍රියාත්මක වන අතරතුර පවා ධීවරයන්ගේ ජීවනෝපාය අවශ්‍යතා සැලකිල්ලට ගෙන අපගේ ප්‍රවේශය මානුෂීය ස්වභාවයක් ගත යුතු යැයි එතුමා ඉල්ලා සිටියේය. විදේශ ලේකම්තුමා දමෙළ ජනතාවගේ අභිලාෂයන් සපුරාලීම සඳහා හැකි ඉක්මනින් පළාත් සභා ජන්දය පැවැත්වීම සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා නායකත්වයේ කැපවීම ක්‍රියාත්මක කරන ලෙස ද ඉල්ලා සිටියේය. විදේශ ලේකම්තුමා 2024 දෙසැම්බර් මස ඒකාබද්ධ ප්‍රකාශයේ ඇතුළත් පරිදි ශ්‍රී ලංකාවේ භූමිය ඉන්දියාවේ ආරක්ෂාවට හානිදායක කිසිදු අයුරකින් භාවිතා කිරීමට අවසර ලබා නොදෙන බවට ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා විසින් ලබා දුන් සහතිකය ද සාදරයෙන් පිළිගත් අතර මෙය ආරක්ෂාව සහ සෞභාග්‍යය සම්බන්ධයෙන් අප දෙරටෙහි ජනතාවගේ අභිලාෂයන් සපුරාලීම සඳහා දෙරට අතර පුළුල් සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායි සංවර්ධන හවුල්කාරිත්වයක් ගොඩනැගීම සඳහා ශක්තිමත් පදනමක් ලබා දෙන බව ප්‍රකාශ කළේය.

9. විදේශ ලේකම්තුමාගේ සංචාරය තුළින්, ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ 2024 දෙසැම්බර් සංචාරය අතරතුර නිකුත් කරන ලද ඒකාබද්ධ

ප්‍රකාශයේ සහ අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ 2025 අප්‍රේල් සංචාරය අතරතුර අත්සන් තබන ලද ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම්වල දැක්වෙන පරිදි, අපගේ නායකයන්ගේ දැක්ම ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දියාවේ අඛණ්ඩ කැපවීම යළි තහවුරු කරන ලදී.

**කොළඹ**
**2026 අගෝස්තු 05**